# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2193/6 - 2020 සැප්තැම්බර් මස 14 වැනි සඳුදා - 2020.09.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### දකුණු පළාතේ පළාත් සභාව

### දකුණු පළාත් සභාවේ 2018 අංක 01 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තියේ 104අ.(12) වගන්තිය යටතේ පනවනු ලබන කාර්ය පටිපාටික රීති සංශෝධනය

දකුණු පළාත් ආණ්ඩුකාරවර විලියම් විජේසිංහ ගමගේ වන මම 2018 අංක 01 දරන දකුණු පළාතේ පළාත් සභාවේ මුදල් (සංශෝධන) ප්‍රඥප්තියේ 104අ. (12) යටතේ පනවනු ලබන කාර්ය පටිපාටික රීති 2118/43 *අති විශේෂ ගැසට් පත්‍රයේ* 1 වන වගන්තියේ (ii) සහ (iii) උපවගන්ති හා 8 වන වගන්තිය සංශෝධනය කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ඇ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, සාදන ලද මෙහි පහත පළ කරනු ලබන, "**පළාත් දිරිගැන්වීමේ ගිණුම පරිපාලන සඳහා වූ රීති සංශෝධන**", *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දින සිට බලපැවැත්විය යුතුය.

**විලියම් විජේසිංහ ගමගේ,**
දකුණු පළාත් ආණ්ඩුකාරවර.

2020 සැප්තැම්බර් මස 09 වැනි දින,
දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
ගාල්ල.

දකුණු පළාතේ පළාත් සභාවේ 2018 අංක 01 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තියේ 104 අ (12) යටතේ පනවනු ලබන කාර්ය පටිපාටික රීති අංක 2118/43 *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 1 වන වගන්තියේ (II) උපවගන්තිය සංශෝධනය කිරීම.

1. දකුණු පළාතේ පළාත් සභාවේ 2018 අංක 01 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තියේ 104 අ (12) යටතේ පනවනු ලබන කාර්ය පටිපාටික රීති අංක 2118/43 *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 1 වන වගන්තියේ (II) උපවගන්තිය අවසානයට පහත සඳහන් කරුණු ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(II) දකුණු පළාතේ ප්‍රධාන ලේකම්, දකුණු පළාතේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුල්‍ය) සහ දිරි දීමනා යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම හා ඇගයීම සඳහා වන කමිටුවට සහභාගී වන දකුණු පළාත් භාණ්ඩාගාරයේ නියෝජිත යන නිලධාරීන් ද දිරි දීමනා යෝජනා ක්‍රමයට ඇතුළත්වන අතර ඒ සඳහා එම නිලධාරීන් දකුණු පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ පැමිණීමේ ලේඛනවල පැමිණීම හා පිටවීම සටහන් කිරීම අවශ්‍යය නොවේ.

දකුණු පළාතේ පළාත් සභාවේ 2018 අංක 01 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තියේ 104 අ (12) යටතේ පනවනු ලබන කාර්ය පටිපාටික රීති අංක 2118/43 *අති විශෙෂ ගැසට් පත්‍රයේ* I වන වගන්තියේ (III) වන උපවගන්තිය සංශෝධනය කිරීම.

2. දකුණු පළාතේ පළාත් සභාවේ 2018 අංක 01 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තියේ 104 අ (12) යටතේ පනවනු ලබන කාර්ය පටිපාටික රීති අංක 2118/43 *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 1 වන වගන්තියේ (111) උපවගන්තිය පහත සඳහන් කරුණු ද ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(III) දකුණු පළාතේ ප්‍රධාන ලේකම්, දකුණු පළාතේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුල්‍ය) සහ දිරි දීමනා යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම හා ඇගයීම සඳහා වන කමිටුවට සහභාගී වන දකුණු පළාත් භාණ්ඩාගාරයේ නියෝජිත යන නිලධාරීන් වෙනුවෙන් අර්ධ වර්ෂයකට ගෙවිය යුතු දිරි දීමනාව එක් එක් නිලධාරියාගේ මාසික වැටුප නොඉක්මවිය යුතුය. එසේ වුවද යම් අර්ධ වර්ෂයක දී 2018 අංක 01 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තියේ 104 අ (12) යටතේ පනවනු ලබන කාර්ය පටිපාටික රීති අංක 2118/43 *අති විශෙෂ ගැසට් පත්‍රයේ* වගන්ති අංක 1 (II) යටතේ දිරිදීමනාවට හිමිකම් ලබන නිලධාරීන්ගේ දිරිදීමනාව වෙනස් වීමකදී එයට අනුපාතිකව මෙම නිලධාරීන්ගේ දිරි දීමනාවද වෙනස් විය යුතුය. තවද "පළාත් දිරිගැන්වීමේ අරමුදල් ගිණුමේ" කටයුතු හා පරිපාලනය සම්බන්ධව තීරණය ගැනීම සඳහා කමිටු සාමාජිකයන් රැස්වීමේ දී දිරි දීමනා සඳහා සුදුසුකම් නොලබන කමිටු සාමාජිකයන් සඳහා එක් අයෙකුට රු. 15,000 බැගින් වන දීමනාවක් හිමිවෙයි.

දකුණු පළාතේ පළාත් සභාවේ 2018 අංක 01 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තියේ 104 අ (12) යටතේ පනවනු ලබන කාර්ය පටිපාටික රීති අංක 2118/43 *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. දකුණු පළාතේ පළාත් සභාවේ 2018 අංක 01 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තියේ 104 අ (12) යටතේ පනවනු ලබන කාර්ය පටිපාටික රීති අංක 2118/43 *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 8 වන වගන්තිය, පහත වගන්තිය ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"මත ප්‍රකාශයක් මගින් ආදායම රැස්කර ගනු ලැබ ඇති අවස්ථාව" යන්නෙන් අදහස් වන්නේ ඉල්ලුම්කරු ඉල්ලා ඇති වටිනාකම සහ මත ප්‍රකාශය ලබා දීමෙන් පසු රැස්කරන ලද ආදායම අතර වෙනස වේ.

10 - 12

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.